# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 10 දරන
# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 මැයි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1994 ජූනි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 10 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත.

[සහතිකය සටහන් කළේ 1994 මැයි මස 31 වන දින]

**එල්. ඩී.—ඕ. 16/93**

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1994 අංක 10 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 20 වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1975 අංක 13 දරන පනතේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.**

> "(3) සාමාන්‍යාධිකාරිවරයා හෝ මණ්ඩලය විසින් විශේෂයෙන් බලය පවරන ලද බැංකුවේ වෙනත් යම් නිලධරයකු හෝ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය. මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් විධාන කළහොත් මිස, සාමාන්‍යාධිකාරිවරයා ද මණ්ඩලය විසින් බැංකුවේ වෙනත් යම් නිලධරයකු මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට බලය පවරනු ලැබ ඇති අවස්ථාවක දී එම නිලධරයා ද මණ්ඩලයේ සෑම රැස්වීමකට පැමිණ ඊට සහභාගි විය යුතු නමුත් ඡන්දය දීමේ කිසිම අයිතිවාසිකමක් ඔහුට නොතිබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

> "එසේ වුවද වාසස්ථානයන් ඉදි කිරීම සඳහා යම් ඉඩමක් මිලට ගැනීම හෝ වාසස්ථානයන් මිලට ගැනීම, ඉදි කිරීම, අලුත් වැඩියා කිරීම, අලුත් කිරීම හෝ අලුතින් කොටසක් සෑදීම සඳහා හෝ මේ පනත යටතේ සාදන ලද රීති මගින් නියම කරන ලද වෙනත් යම් කාර්යයක් සඳහා හෝ බැංකුව විසින් තම සේවා නියුක්තයන්ට ණය ලබා දිය හැකි ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ක) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.**

> "(ක) යම් අවස්ථාවක ණයට ගනු ලබන හා තැන්පතු වශයෙන් භාරගනු ලබන මුදලෙහි සමස්තය අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන උපරිම සීමාව නොඉක්මවන ලෙස,

ඔවුන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන නියම හා කොන්දේසි මත, ආණ්ඩුවෙන් හෝ වෙනත් යම් ආයතනයකින් මුදල් ණයට ගැනීම හෝ තැන්පතු භාර ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 31ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"චාර තැන්පතු ඇති තැනැත්තන් විසින් නාමනය කිරීම.

31ආ. (1) වයස අවුරුදු දහසයකට වැඩි වූ ද බැංකුවේ චාර තැන්පතුවක් ඇති වූ ද, තැනැත්තකු විසින් (මෙහි මින් මතු "නාමයෝජක" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු නම් කරනු ලැබිය හැකි අතර (මෙහි මින් මතු "නාමිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි මුලින් සඳහන් කරන ලද තැනැත්තාගේ බැරට ඇති මුදල් එකී නාමයෝජක මියයාමේ දී ඉහත සඳහන් නාමිතයා වෙත ගෙවනු ලැබිය යුතු ය. මරණය සිදුවූයේ තැන්පතුව පවතින කාලයේ දී නම්, මෙම පනතේ විධිවිධානවලට යටත්ව මුදල් ගෙවිය යුතු ය.

(2) නාමයෝජකගේ අන්තිම කැමති පත්‍රයේ පටහැනිව කුමක් සඳහන් වුවද, ඔහුගේ මරණින් පසුව (1) වන උපවගන්තිය යටතේ කරන ලද නාමනය කිරීමක් බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නාමනය කිරීමක් නාමයෝජක ජීවත්ව සිටින විට නාමිතයා මියයාමේ දී හෝ (නාමයෝජකගේ අත්සන සහතික කරන) සාක්ෂිකරුවකු ඉදිරිපිටදී නාමයෝජක විසින් අත්සන් කරනු ලබන ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ලිඛිත දැන්වීමක් මගින් හෝ නාමයෝජක විසින් පසුව කරනු ලබන යම් නාමනය කිරීමක් මගින් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නාමනය කිරීමක් කරනු ලැබ ඇති තැනැත්තකුගේ බැරට චාර තැන්පතුවක ඇති මුදල්, ඔහු මිය යාමේ දී, සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ ප්‍රොබේට් බල පත්‍රයේ හෝ අද්මිනිස්ත්‍රාසිකරණ කාර්ය පටිපාටියේ

කාර්ය සඳහා එම තැනැත්තාගේ බූදලය හෝ දේපළ වල කොටසක් ලෙස සලකනු නොලැබිය යුතු අතර එම දේපළ පැවරීම එම නාබු විධාන සංග්‍රහය යටතේ වරදක් නොවිය යුතු ය.

(5) යම් නාමිතයකු—

(අ) තමා එම නාමිතයා බවට සඳහන් කරමින් දිවුරුම්පත්‍රයක් ඉදිරිපත් කරන්නේ නම් මිස ; සහ

(ආ) බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි තැනැත්තකුගෙන් ස්වකීය අනන්‍යතාව පිළිබඳව සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් මිස

එම නාමිතයාට බැංකුව විසින් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.

(6) මියගිය නාමයෝජකයකුගේ යම් නාමිතයකුට (5) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව කරන ලද මුදල් ගෙවීමක්, එම නාමයෝජකයාගේ බැරට තිබූ මුදල් සම්බන්ධයෙන් බැංකුවේ වගකීම සම්පූර්ණයෙන් ඉවු කිරීමක් විය යුතු ය.

(7) වාර තැන්පතුවක් ඇති නාමයෝජකයකු නොවන යම් තැනැත්තකු මිය ගිය විට, එම තැනැත්තාගේ බැරට බැංකුවේ යම් මුදලක් ඇති අවස්ථාවක දී, එසේ මුලින් සඳහන් තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය බවට හා යම් ලිඛිත නීතියක් අනුව එම තැනැත්තාගේ බූදලයට අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර අවශ්‍ය නොවන බවට යම් නිලධරයකු හෝ ගිණුම් සම්බන්ධයෙන් මුදල් ගෙවීමට නිසි පරිදි බලය පවරනු ලැබ ඇති තැනැත්තකු හෝ සෑහීමට පත් වන්නේ නම් එම නිලධරයා හෝ තැනැත්තා විසින් එම මුදල මේ පනතේ විධිවිධානවලට යටත්ව ඒ සම්බන්ධයෙන් ඇති යම් රීතියකට අනුකූලව එම මුදල ගෙවීමට නියමිත තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවනු ලැබිය හැකි ය:

එසේ වුවද ඒ සම්බන්ධයෙන් රීති සාදනු ලබන තෙක්, මුදල් ගෙවනු ලැබීමට නීත්‍යනුකූලව හිමිකම් ඇති තැනැත්තාට එම මුදල ගෙවනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් දක්වා ණය ලබාදීම සඳහා සාමාන්‍යාධිකාරිවරයාට හෝ බැංකුවේ වෙනත් යම් නිලධර යකුට මණ්ඩලය විසින් බලය පවරනු ලැබිය හැකි ය."; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ සාමාන්‍යාධිකාරීවරයා විසින් හෝ බැංකුවේ වෙනත් යම් නිලධරයකු විසින් ලබා දෙන ලද ණය මුදල් මණ්ඩලයේ ඊළඟ රැස්වීම් වාරයේ දී මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) බැංකුවේ පොදු මුද්‍රාව, මණ්ඩලයේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීම සඳහා මණ්ඩලය විසින් බලය පවරන ලද බැංකුවේ යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු අතර, එම නිලධරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට එම මුද්‍රාව නොතැබිය යුතු ය. තවද තමන් සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් සියලු දෙනාම ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

74. (1) පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කරුණු;

(ආ) ඍණ පත්‍ර නිකුත් කිරීම, ලියාපදිංචි කිරීම, පැවරීම, නිදහස් කිරීම හා අවලංගු කිරීම සහ ඒ නිකුත් කිරීමට, ලියා පදිංචි කිරීමට, පැවරීමට, නිදහස් කිරීමට හෝ අවලංගු කිරීමට ප්‍රාසංගික හෝ ආනුෂංගික සියලු කරුණු;

(ඇ) මේ පනතේ යම් යම් කාර්ය සඳහා භාවිත කරන ආකෘති පත්‍ර;

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 355, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නාම පර්යන්තයෙන් දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව මිලදීගත ඒ ඒ පිටපත් සඳහා ද වෙනම ගෙවිය යුතුය.